පුදුකුඩිඉරුප්පු ප්‍රාදේශිය සභාව

මුලතිව් දිස්ත්‍රික්කය.

-----------------------------------

1. මුල්‍ය ප්‍රකාශ

-----------------

1.1 මුල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම

----------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශ 2014 අගෝස්තු 02 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශ 2013 අප්‍රේල් 02 දින ඉදිරිපත් කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 30 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

1.2 මතය

----------

මෙම වාර්තවේ 1.3 ඡේදයේ දැක්වෙන කරුණු වලින් මුල්‍ය ප්‍රකාශයන්ට වන බලපෑම හැර, 2013 දෙසැම්බර් 31 දිනට පුදුකුඩිඉරුප්පු ප්‍රාදේශිය සභාවේ වැඩකටයුතු වල තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් වල මුල්‍ය ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදු සම්මත ගිණුම්කරණ මූලධර්මයන්ට අනුකූලව මුල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.3 මුල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

i. මුල්‍ය ප්‍රකාශයන්හි නිරීක්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු ආදායම්, වගකීම් සහ වත්කම් යටතේ පහත වගුවෙහි දැක්වේ.

| මුලා ප්‍රකාශයන් කෙරෙහි බලපෑම | ආදායම් | | වගකීම් | | වත්කම් | |
|---|---|---|---|---|---|---|
| | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම |
| | | රු. | | රු. | | රු. |
| වැඩියෙන් දැක්වීම් | 01 | 2,473,550 | 02 | 16,639,639 | 01 | 143,455 |
| අත්හැරීම් | - | - | 01 | 812,308 | - | - |

ii. සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ තුලදී සභාව විසින් ලබාගත් වාහන 13 ක අගය තක්සේරු කර අවසන් ගිණුම් වලට ඇතුලත් කර නොතිබුණි. එබැවින් වාහන වල අගය ගිණුම් වල අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම නිසා වටිනාකම ර.33,940,406 ක් වූ ගනුදෙනු 03 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරිමට නොහැකි විය.

1.3.3 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවූ පහත සඳහන් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) ප්‍රාදේශිය සභා ( මුලා සහ පරිපාලන) රීති - 1988 | | |
| i. III පරිච්ඡේදයේ 66 වගන්තිය | - | රු.13,332,836 ක් වූ හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| ii. රීති අංක 234 | - | වටිනාකම රු.5,478 ක් වූ මුදල් නොකළ චෙක්පත් 3 ක් විවිධ තැන්පතු ගිණුමෙහි ඇතුලත් කර තිබුණි. |

iii. රීති අංක 571 - කල් ඉකුත් වූ රු.414,000 ක් වූ ටෙන්ඩර් තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 අංක 14 දරන දේශීය ආදායම් පණත - එකතු කළ අගය මත බදු රු.157,833 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය නොකර විවිධ තැන්පතු ගිණුමට ඇතුළත් කර තිබුණි.

(ඇ) 1983 අංක 24 දරන වැන්දඹු සහ අනත්දරු පණත - රු.4,340 ක් වූ නිලධාරීන්ගේ දායක මුදල් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

## 2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් අතිරික්තය රු.23,567 ක් වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය රු.7,940,686 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

අයවැය ලේඛනය නිසි පරිදි පිළියෙල කර නොතිබුණි. එබැවින් අයවැයගත ආදායම් හා වියදම් සහ තථ්‍ය ආදායම් සහ වියදම් අතර පිළිවෙලින් රු.10,559,796 ක් සහ 17,958,105 ක් වූ වෙනස්කම් පැවතුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 25 | 90 | - |
| බදු කුලී | 8,646 | 9,766 | - |
| බලපත්‍ර ගාස්තු | 2,948 | 2,559 | - |
| වෙනත් ආදායම් | 29,473 | 18,208 | 13,332 |
| | 41,092 | 30,623 | 13,332 |

2.3.2 ආදායම් කළමනාකරණය

(අ) කුලී

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ සඳහා සභාවට අයවිය යුතු රු.858,023 ක් වූ හිඟ කුලී අයකර ගැනීම සඳහා නීතිමය සහ ඵලදායි පියවර ගෙන නොතිබුණි.

(ආ) බලපත්‍ර ගාස්තු

බලපත්‍ර ගාස්තු ලැබුණු විටදී පමණක් ගිණුම් ගතකර තිබුණු අතර හිඟ බලපත්‍ර ගාස්තු ගිණුම් ගතකර නොතිබුණි.

(ඇ) උසාවි දඩ

සමාලෝචිත වර්ෂය සඳහා වූ උසාවි දඩ රු.11,585,763 ක් ලැබිය යුතු මුදල් ලෙස ගිණුම් ගතකර තිබුණි. නමුත් මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මුද්දර ගාස්තු

----------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා වූ මුද්දර ගාස්තු රු.484,600 ක් ලැබිය යුතු මුදල් ලෙස ගිණුම් ගතකර තිබුණි. නමුත් මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.4 අයකර ගතයුතු කාර්ය මණ්ඩල ණය

-------------------------------------------

විශ්‍රාමික නිලධාරීන් දෙදෙනෙකුගෙන් කාර්ය මණ්ඩල ණය රු.97,775 ක් අයවිය යුතුව තිබුණි. නමුත් මෙම වාර්තාවේ දින දක්වාම එම මුදල් ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.5 වත්කම් කළමනාකරණය

-------------------------------

සමීක්ෂණ මණ්ඩල වාර්තාව සහ තොග ලේඛනය සැසඳීමේදි විෂයයන් 4 ක අතිරික්තයක් ද විෂයයන් 2 ක ඌනතාවයක් ද අනාවරණය විය.

2.6 නිම නොකළ ව්‍යාපෘති

--------------------------

සමාලෝචිත වර්ෂය තුල නිම කළයුතු රු.556,962 ක් වටිනා ව්‍යාපෘති දෙකක් මෙම වාර්තාවේ දින දක්වා නිම කර නොතිබුණු නමුත් එම වටිනාකම ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගතකර තිබුණි.

3. පද්ධති සහ පාලන

-------------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුවිය යුතුය

(අ) තැන්පතු

(ආ) විවිධ තැන්පතු

(ඇ) අත්තිකාරම්

(ඈ) ආදායම් රැස්කිරීම

(ඉ) අයවැය ලේඛනය